# සැවුලා වන්නම

තාලය - සුළු මහ (මාත්‍රා 2, 4) දෙතිත

බෙර පදය - දොං දොං ජිං ජිං ගජිගත

තානම - තම් තම්දන තානම්
දන තම්දන තානම්
තම් තම්දන තානත් තෙයි
තම්ද නා තම්දෙ නා නා

කවිය -
සුරි දුන් පෙර සිටන් - බලයුත් සැවතිඳුන්
සහගොස් කළ යුදෙන් - අසුරන් ජය නො ලදින්

බර අත් ගෙන කගින් - ඇන කොන්තවි වලින්
අසුරන් කළ යුදෙන් - ජය ගෙන කඳ කුමරුන්

ගසමින් කග පතින් - දෙපළුව අසුර සෙන්
දැරුපා අතළුවෙන් - පළු දෙක ගෙන සැණෙකින්

එම වන් පළුවකින් - එ උපන් සැණෙකින්
සැවුලා නම එයින් - ලොව පළ කළ උපතින්


සැකසුම-: ආර්.ජ්.මතුල රත්නායක
ගුරු උපදේශක

කස්තිරම - කුඳ ගජිගත /// කුඳ තා

කුඳ ගජිගත /// කුඳ තා

කුඳ ගජිගත කුඳ තා //

කුඳ තා //

කුඳ ගජිගත /// කුඳ තා

සීරුමාරුව - තකු තක තරිකිට කුංදත්

ගත් ජිත් තක ජිත් කුංදත්

තකු තක තරිකිට කුන්දත් දොං තා

අඩව්ව - ජෙන් තත් තත් ///ජෙන් තා

ජෙනු තත් තත් /// ජෙනු තා

ජෙන් තත් තත් ජෙන් තා

ජෙනු තත් තත් ජෙනු තා

ජෙන් තා - ජෙනු තා

දොහොකඩ තා - දොහොකඩ ගත කුඳ

දොහොකඩ තා